රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :12/2005

මගේ අංකය :- ආ7/4/1/22
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2005 මැයි මස 18 වැනි දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරීන් සඳහා වූ**
**<u>නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)</u>**

2005 අයවැය යෝජනා මගින් රාජ්‍ය නිලධාරීන්ට සමාන හා වැඩි ප්‍රතිලාභ හිමිවන රක්ෂණ යෝජනා ක්‍රමයක් ඇති කිරීමට රජය තීරණය කර ඇත.

02. ඒ අනුව 1997.01.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 5/97 හා ඒ හා සම්බන්ධ කරමින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන වෙනුවට පහත සඳහන් දායක රක්ෂණ යෝජනා ක්‍රමය 2005.01.01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

03. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය පහත සඳහන් අංග 03 කින් සමන්විත වේ.

I. වෛද්‍ය රක්ෂණාවරණය
II. පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණාවරණය.
III. ණය සුරැකුම් රක්ෂණාවරණය

**04. සුදුසුකම්**

ස්ථිර හා විශ්‍රාම වැටුප් / දායක විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සියලු ම නිලධාරීහු මේ සඳහා සුදුසුකම් ලබති.

**05. වාරික ගෙවීම**

I. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සියලු ම නිලධාරීන් මෙම දායක රක්ෂණ ක්‍රමයට දායකවීම අනිවාර්යයවේ. ඒ සඳහා ඔවුන්ගේ මාසික වැටුපෙන් රු.75/- ක් බැගින් වූ වාරික මුදලක් අය කරනු ලබන අතර, එම වාරිකය සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යැවිය යුතුවේ.

II. එක් එක් නිලධාරියකු වෙනුවෙන් රජය මාසික ව රු.69/- ක දායක මුදලක් ගෙවනු ලැබේ.

III. මෙම රක්ෂණ ක්‍රමයට දායක වී ඇති රාජ්‍ය නිලධාරින්ගේ සංඛ්‍යාව අනුව වාර්ෂික ව රජය විසින් ගෙවනු ලබන මුළු දායක මුදල මාසික වාරික ලෙස මහා භාණ්ඩාගාරය විසින් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවිය යුතුය.

IV. ඒ ඒ ආයතනවලින් මාසික ව සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යවා ඇති වාරික මුදල් ප්‍රමාණය හා සාමාජික සංඛ්‍යාව පිළිබඳව වූ වාර්තාවක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

**06.** ප්‍රතිලාභ

වෛද්‍ය රක්ෂණ ක්‍රමයෙන් ලැබෙන ප්‍රතිලාභ ඇමුණුම (1) හි I වන කොටසින් ද පෞද්ගලික හදිසි අනතුරු හා ස්වාභාවික මරණ රක්ෂණාවරණයේ ප්‍රතිලාභ II වන කොටසින් ද ණය සුරැකුම් රක්ෂණාවරණ III කොටසින් ද දක්වේ.

පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණය හා ණය සුරැකුම් රක්ෂණය සඳහා හිමිකම් ලැබෙනුයේ අදාල නිලධාරියා නීති විරෝධී නොවන ක්‍රියාවක නිරතවීම හේතුවෙන් හදිසි අනතුරකට පත් වුවහොත් පමණි. සේවයෙන් පහ කිරීම/ විදේශ නිවාඩු ලබා ගැනීම (රාජකාරි විදේශ නිවාඩු හැර) වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම/ විදේශ රැකියාවක නිරතවීම/ සේවයෙන් ඉවත් වීම හෝ සේවය අතහැරයාම යන අවස්ථාවලදී පෞද්ගලික හදිසි අනතුරු රක්ෂණය හා ණය සුරැකුම් රක්ෂණාවරණය සඳහා හිමිකම් නොලැබේ.

වැටුප් රහිත මෙරට නිවාඩු ලබාගන්නා නිලධාරින් වාරික මුදල් ගෙවීමට සුදුසු වැඩපිළිවෙලක් යොදන්නේ නම් පමණක් ඒ සඳහා ඔවුනට හිමිකම් ලබාගත හැක.

**07.** රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම

I. රෝහල් ගතවීමකදී හෝ හදිසි අනතුරකදී හෝ ස්වාභාවික මරණයක් සිදු වූ විටක දී හෝ දින 07 ක් ඇතුළත ඒ බැව් දෙපාර්තමේන්තු ප්‍රධානයාට දන්විය යුතුය. අදල සියලු ම වෛද්‍ය ගාස්තු හා රෝහල් බිල්පත් ප්‍රතිලාභ ඉල්ලුම්පතට අමුණා දෙපාර්තමේන්තු ප්‍රධානයා මගින් මසක් ඇතුළත සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රාදේශීය කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුය. අදල ඉල්ලුම්පතට බිල්පත්වල මුල් පිටපත් ඇමිණිය යුතුය.

II. සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් සතියේ වැඩ කරන දින 10 ක් ඇතුළත මෙම ප්‍රතිලාභ ගෙවීමට ක්‍රියා කළ යුතුය.

III. රෝගියා රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන්නේ නම් නිවස වෙත කැඳවා ගෙන ඒමට පෙර පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම්දීම අනිවාර්යයෙන් ම කළ යුතුය.

**011-2357357**
**011-2357000**

IV. පළමු වරට ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානයා විසින් සහතික කරනු ලැබූ මෑතකදී ලබාගත් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය.

08. ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම

I. යම් කිසි සාමාජික නිලධාරියකු ව්‍යාජ බිල්පත් හෝ වෛද්‍ය සහතික ඉදිරිපත් කොට ඇත්නම් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ඒ බැව් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත වාර්තා කළ යුතුය.

II. එම වාර්තා අනුව සාමාජිකයා අයත් දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මගින් ඔහුට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය පියවර ගනු ලැබේ.

III. නිලධාරියා වැරදිකරුවකු වුවහොත් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන හා දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන ද අනුව ක්‍රියා කරනු ලැබේ.

09. යම් නිලධාරියකු රජයේ සේවයෙන් ඉල්ලා අස්වුවහොත්, විශ්‍රාම ගියහොත් තනතුර අතහැර ගියහොත් හෝ සේවයෙන් පහ කරනු ලැබුවහොත් යන කවරාකාරයකින් හෝ රාජ්‍ය සේවයෙන් බැහැරවී ඇත්නම් මෙම රක්ෂණාවරණය අහිමිවනු ඇත. එවැනි නිලධාරීන් පිළිබඳ වාර්තා නොපමා ව සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත යැවීමට දෙපාර්තමේන්තු ප්‍රධානයා ක්‍රියා කළ යුතුය.

10. සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් මාසිකව ප්‍රතිපූරණය කරනු ලබන වියදම් වාර්තා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත හා මහා භාණ්ඩාගාරය වෙත ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

11. පැවති අග්‍රහාර රක්ෂණ ක්‍රමය යටතේ රාජ්‍ය නිලධාරීන් ණය රක්ෂණ සුරැකුම් ඇපයට තබා ලබාගෙන ඇති ණය මුදල් ප්‍රමාණයන් ද මෙම දයක රක්ෂණ ක්‍රමයෙහි නව විධිවිධාන යටතේ ඒ අයුරින් ම ක්‍රියාත්මක වේ.

12. 2005.05.01 දින දක්වා ලබා ගැනීමට ඇති ප්‍රතිලාභ වෙනුවෙන් හිමිකම්පත් ඉදිරිපත් කිරීමට 2005.08.01 දක්වා සහන කාලයක් හිමිවේ. එසේම ප්‍රතිලාභ ඉල්ලුම්පත් ලද වහාම සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානයා නොපමාව පියවර ගත යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම (1)

1 කොටස

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

| | ප්‍රතිලාභ වර්ගය | සීමාව |
|---|---|---|
| 01 | රෝහල් සහ සාත්තු නිවාස ගාස්තු | රු. 21,000.00 (දිනකට කාමර ගාස්තුව රු.1500/- ක් බැගින්) |
| 02 | උපදේශක විශේෂඥ වෛද්‍යවරයන්ගේ නිර්දේශ මත ලබා දෙන විශේෂ ප්‍රතිකාර හා හෙද සේවා සඳහා සහ රෝහල්, සාත්තු නිවාසයන්හි විශේෂඥ ප්‍රතිකාර සඳහා වැයවන වෛද්‍ය සහ ශල්‍ය කර්ම වියදම් හා ශල්‍යාගාර ගාස්තු සහ ශල්‍ය කර්ම සඳහා ශල්‍ය හා නිර්වින්දන වෛද්‍යවරුන්ගේ ගාස්තු | රු. 50,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 03 | පිළිගත් වෛද්‍යවරයකුගේ හෝ වෛද්‍ය සේවා ආඥා පනතේ 41 යටතේ ලියාපදිංචි කළ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත ආරෝග්‍ය ශාලාවක හෝ සාත්තු නිවාසයක නේවාසික ප්‍රතිකාර ලබා ගැනීමේදී වෛද්‍ය උපදේශක සේවා හෝ විශේෂඥ වෛද්‍ය ගාස්තු සඳහා | රු. 15,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 04. | සූක්ෂම චිකිත්සා ප්‍රතිකාර, එක්ස් කිරණ රශ්මි හා රේඩියම් පරීක්ෂණ හා ප්‍රතිකාර, විදුලිමය ප්‍රතිකාර, කායික චිකිත්සා ප්‍රතිකාර යන මේවා ඇතුළු විශේෂඥ සේවා ගාස්තු | රු. 20,000.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 05. | ඉහත 1 සිට 4 දක්වා ප්‍රතිලාභ හිමි පුද්ගලයකුගේ හදිසි රෝගාබාධයකදී ජීවිතය බේරා ගැනීම සඳහා පදිංචි ස්ථානයේ සිට ළඟ ම ආරෝග්‍යශාලාවට හෝ සාත්තු නිවාසයට ගෙනයාමට සිදුවුවහොත් ගමන් ගාස්තු | රු. 1,500.00 (පවුල් ඒකකයක් සඳහා) |
| 06. | ඉහත සඳහන් අංක 01 සිට 05 දක්වා සිද්ධීන් වෙනුවෙන්<br>(අ) එක් සිද්ධියක් සඳහා උපරිමය<br>(ආ) එක් වර්ෂයක් සඳහා උපරිමය | රු. 100,000.00<br>රු. 150,000.00<br>( කලත්‍රයා ද රාජ්‍ය සේවයේ යෙදී සිටින්නේ නම් දෙදෙනාට ම රු. 300,000.00 ප්‍රතිලාභ හිමි වේ.) |

| | | |
|---|---|---|
| 07 | සාමාජිකයන් සඳහා පමණක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි අක්ෂි පිලිබඳ විශේෂඥ වෛද්‍යවරයකුගේ නිර්දේශය මත වසර තුනකට වරක් ඇස්කණ්නාඩි ලබා ගැනීම. | රු. **3,500.00** |
| 08. | රජයේ රෝහලක හෝ ආයුර්වේද රෝහලක වාට්ටුවක නේවාසිකව ප්‍රතිකාර ලබා ගන්නේ නම් සාමාජිකයන් සඳහා | රු. **5000.00**<br>(දිනකට රු.500/- බැගින්) |
| 09 | I. සාමාන්‍ය දරු උපතකදී හෝ ස්වාභාවික ගබ්සාවීමකදී පෞද්ගලික හෝ රජයේ රෝහලක නේවාසිකව සිටින්නේ නම් ජීවිත කාලයට ම දෙවරක් (උපරිමය)<br><br>II. සාමාජික නිලධාරිනියක් වෙනුවෙන් පෞද්ගලික ආරෝග්‍යශාලාවක සිදුවන දරු උපතක් වෙනුවෙන් ජීවිත කාලයට ම දෙවරක් | දිනකට රු. 500/- බැගින් උපරිමය දින 05<br><br>දිනකට රු. 1,000.00 බැගින් උපරිමය දින 05 |
| 10. | I. සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් හෘදය ආශ්‍රිත ශල්‍ය කර්ම වෙනුවෙන් ප්‍රතිපූරණය කිරීම (උපරිමය)<br>1. Heart Attack - (Myocardial Refraction)<br>2. Coronary Artery Disease (Coronary by - pass Surgery)<br>3. Stroke (Cerebra Vascular Accident)<br><br>II. සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් ශල්‍යකර්ම සඳහා (උපරිමය)<br>1. Cancer<br>2. Renal Failure<br>3. Major Organ Transplant, such as lung or bone marrow, However this benefit will not be paid to a donor of a major organ.<br>4. Paralysis<br>5. Multiple Sclerosis<br>6. Primary Pulmonary Arterial Hypertension<br>7. Fulminate Hepatitis | රු. **350,000.00**<br><br>රු. **100,000.00** |

<u>**පවුල් ඒකකය**</u>

විවාහක සේවකයන් :- සාමාජිකයා, කලත්‍රයා සහ රැකියා විරහිත අවිවාහක හා යැපෙන අවුරුදු 21 ට අඩු දරුවන්

අවිවාහක සේවකයන් :- සාමාජිකයා සහ වයස අවු. 70 ට අඩු සාමාජික නිලධාරියාගේ දෙමව්පියන්

## II වන කොටස

## පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණාවරණය

රාජ්‍ය සේවයේ හා පලාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් හිමි/දායක විශ්‍රාම වැටුප් හිමි සියලු ම නිලධාරීහු පැය 24 පුරා ම මෙම රක්ෂණ ක්‍රමයෙන් ආවරණය වෙති.

**ලැබෙන ප්‍රතිලාභ**

| | | | |
|---|---|---|---|
| I. | රක්ෂණාවරණය | - | දවසේ පැය 24 පුරා ම |
| II . | උපරිම වයස් සීමාව | - | අවුරුදු 60 දක්වා |
| III. | රක්ෂිත මුදල | - | රු. 600,000.00<br>හදිසි අනතුරකින් මරණය සිදුවුවහොත් හෝ පූර්ණ අකර්මණ්‍යතාවකට පත්වුවහොත් හෝ රක්ෂිත මුදල යැපෙන්නන් අතර බෙදනු ලැබේ. |
| IV. | ගෙවනු ලබන මුදල | - | රු. 600,000.00 |

අ. **ස්ථිර අකර්මණ්‍යතාව**

| | |
|---|---|
| හදිසි අනතුර නිසා සිදුවන මරණයකදී හෝ ස්ථිර පූර්ණ අකර්මණ්‍යතාවකදී | සම්පූර්ණ රක්ෂිත මුදල |

ආ. **ස්ථිර අර්ධ අකර්මණ්‍යතාව**

| | |
|---|---|
| එක් පාදයක් අහිමි වීම , එක් ඇසක් අහිමිවීම<br>එක් අතක් අහිමි වීම | රක්ෂිත මුදලින් 50% ක් |

ඇ. **තාවකාලික පූර්ණ අකර්මණ්‍යතාව**

i. සති 52 ක කාලයක් සඳහා - සතියකට රු. 300/- බැගින්

ඈ. **තාවකාලික අර්ධ අකර්මණ්‍යතාව**

i. සති 52 ක කාලයක් සඳහා - සතියකට රු. 200/- බැගින්

ඉ. ස්වභාවික මරණයක් සඳහා රු. 50,000/- යි.

**III වන කොටස**

## ණය සුරැකුම් රක්ෂණාවරණය

මෙම රක්ෂණ ක්‍රමය මගින් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය යටතේ රජයේ සේවකයන් විසින් ලබා ගන්නා දේපල ණය හැර අනිකුත් ඇපකරුවකු හෝ ඇපකරුවන් අවශ්‍ය වන සියලු ම ණය වර්ග ආවරණය වේ. යම් හෙයකින් රජයට අයවිය යුතු ණය මුදලක් ණයකරුට ගෙවිය නොහැකි වූ විට ණය මුදල රක්ෂණ සංස්ථාව විසින් රජයට ගෙවනු ලැබේ. මේ යටතේ නිලධාරියකුට ඇපයට තැබිය හැකි උපරිම ණය මුදල් ප්‍රමාණය රු.600,000/- කට සීමාවේ.

## ප්‍රතිලාභ

I. ණය ගැතියා රෝගාතුර වීමෙන් හෝ අනතුරකින් අර්ධ හෝ පූර්ණ අකර්මණ්‍යතාවකට පත්වී නියමිත ජීවනෝපාය අහිමි වුවහොත් හෝ ජීවිත හානියකට පත් වූ විට හෝ ණය මුදලේ ශේෂය රජයට ගෙවීමට රක්ෂණ සංස්ථාව බැඳී සිටී.

II. ණය සුරැකුම් රක්ෂිතය උපරිම රු.600,000/- ක් වන අතර, නිලධාරියාගේ වැටුප අනුව ඔහුට හිමි ණය ප්‍රමාණය තීරණය වනු ඇත.

III. රක්ෂිත මුදල - ණය මුදලේ ශේෂය

IV. ණය මුදල ආපසු ගෙවීම - ආපසු ගෙවන කාලය වයස අවුරුදු **55** හෝ සේවය දීර්ඝ කර ඇත්නම් අවුරුදු **60** නොඉක්මවිය යුතුය.